**කුරුණෑගල මහා නගර සභාව - 2020**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

කුරුණෑගල මහා නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

  - අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

  - භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ, ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

  - මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) මහා නගර සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයයන් 02 කට අදාළව රු.11,568,364 ක වටිනාකමක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | ලැබිය යුතු උසාවි දඩ නියමිත පරිදි ගිණුම් ගත කර ඇති බවත් සේවක ණය, ජල තැන්පත් ශේෂවල වෙනස්කම් කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. |
| (ආ) | ගිණුම් විෂයයන් 03 කට අදාළව රු.47,705,494 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | සියළුම ගිණුම මඟහැරීමකින් තොරව ගිණුම් තැබීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | සියළුම ගිණුම් මඟහැරීමකින් තොරව නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සභාවේ ගොඩනැගිලි 3 ක් සංවර්ධනයට දරා තිබූ රු. 89,340,481 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේදී විගණනය සමඟ සාකච්ඡා කර වික්‍රමනායක ගිණුම් ක්‍රමය යටතේ ගිණුම් තැබීම සඳහා උපදෙස් ලබාගන්නා බව දන්වා සිටිමි. | ගොඩනැගිලි සංවර්ධන වියදම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. |
| (ඈ) | මහා නගර සභාව සතු වාහන ප්‍රත්‍යාගණන වටිනාකම නිවැරදිව ගිණුම්ගත නොකිරීම හේතුවෙන් මෝටර් රථ හා කරත්ත වටිනාකම රු. 11,305,363 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නගර සභා මෝටර් රථ හා කරත්ත උපලේඛනය හා මෝටර් රථ ගිණුම නිවැරදි කිරීම සඳහා කටයුතු කරන බව දන්වා සිටිමි. | මෝටර් රථ හා කරත්ත නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | නගර සභා ණය මුදල් මගින් සිදු කරන ලද රු.506,074,880 ක වියදම් ජ’නල් සටහන් 54 මගින් ගොඩනැගිලි ගිණුම හර කර ප්‍රාග්ධන වියදම් ගිණුම බැර කිරීම නිසා ප්‍රාග්ධන වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබූ අතර, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී විගණනය විසින් ලබාදෙන ලද උපදෙස් මත කටයුතු කරන බව දන්වා සිටිමි. | ණය මුදල් ලබා ගැනීම හා එම මුදල් වලින් කරන සංවර්ධන වියදම් නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. |
| (ඊ) | වර්ෂය තුළ ගිවිසුම්ගත වීමක් හෝ ඉටුනොවී අත්හැර තිබූ ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් රු.7,650,000 ක මුදලක් ණයහිමි ලෙස ගිණුම්ගත කර තිබුණි. | ගිවිසුම් ගත වී නොමැති ව්‍යාපෘති සඳහා ණය හිමි වෙන්කිරීම් සිදු නොකිරීමට කටයුතු කරන බව දන්වමි. | ණය හිමියෝ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. |
| (උ) | සමාලෝචිත වර්ෂය තුළ මිලදීගෙන තිබූ රු.6,441,600 ක් වටිනා කන්ටේනර් පෙට්ටි 04 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | අදාළ කන්ටේනර් පෙට්ටි ප්‍රාග්ධනිත කිරීම සඳහා කටයුතු කරන බව දන්වා සිටිමි. | වර්ෂයට අදාල සියළුම යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතුවට අදාළ රු.7,000,000 ක පොලී ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | ස්ථාවර තැන්පතුව සඳහා පොලිය ගණනය කර ගිණුම් වලට ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි | පොළී ආදායම් නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතු වේ. |
| (එ) | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් අනුමැතියකින් තොරව ඉවත්කර තිබූ රු.5,934,935 ක් වූ රජපිහිල්ල තානායමෙන් අයවිය යුතු මුදල් ගිණුම්ගත කර නොතිබුණි. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් සටහන් මගින් අනාවරණය කර ඇති බව සඳහන් කරමි. | ගිණුම් සටහන් යටතේ අනාවරණය කර නොතිබුණු බවත්, විධිමත් අනුමැතියකින් තොරව ආදායම් ඉවත් නොකර ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඒ) | ජ’නල් සටහන් 55 මගින් වියදම් ආපසු ලැබීම් රු.5,104,758 ක මුදල වියදම් ආපසු ලැබීම් ගිණුමට බැරකිරීම වෙනුවට හරකර ප්‍රාග්ධන වියදම් ගිණුමට හර කිරීම වෙනුවට බැරකර තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි නිවැරදිව ගිණුම් තැබීම සඳහා කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සුන්දරාපොළ කසළ අංගනයේ පැවති රු.6,240,144 ක් වටිනා පොහොර බෑග් තොගය ගිණුම්ගතකර නොතිබුණි. | පොහොර බෑග් සුන්දාරාපොල කසල අංගනයට නිකුත් කර ඇති බව දන්වමි. | මහා නගර සභාවේ සියළුම පරිශ්‍රවල ඇති වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඕ) | ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අතර රු.545,417,039 ක වෙනසක් විය. | ඉදිරියේ දී විගණනය සමග සාකච්ඡා කර අදාල ගිණුම්වල අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 14 ක මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා අනුරූපී වාර්තා අනුව වටිනාකම අතර රු.299,219,011 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති ගිණුම් විෂයයන් 14 කට අදාල උපලේඛණවල වර්ෂ ගණනාවක සිට පවතින වෙනස්කම් බවත් සමහර වටිනාකම් 2020 වර්ෂය තුල දී නිවැරදි කර ඇති බවත් 2021 වර්ෂය තුල ගිණුම් සමහ ගැලපීමේ කටයුතු සිදු කරන බවත් දන්වා සිටිමි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 57,371,648 ක් වූ ගිණුම් විෂයයන් 10 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් වලට අදාල උපලේඛන කඩිනමින් සකස් කිරිම සඳහා කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනතේ 185 (1) වගන්තිය | සෑම මහා නගර සභාවකටම මහා නගර සභා අරමුදලක් පිහිටුවිය යුතු බවට උපදෙස් ලබා දී ඇතත්, නගරාධිපති අරමුදලක් පිළිබඳව පනතේ විධිවිධාන සලසා නොතිබියදී වාර්ෂික අයවැයෙන් රු.2,279,800 ක මුදලක් ප්‍රතිපාදන සලසාගෙන රු.2,008,852 ක මුදලක් වැයකර තිබුණි. | මහා නගර සභා ආඥා පනතේ 215 වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවට ඇති බලතල පරිදි නගර සභා අයවැය ලේඛනය වෙත නගරාධිපති අරමුදල නමින් වැය විෂයයක් අන්තර්ගත කර ඇති බව දන්වා සිටිමි. | මහා නගර සභා ආඥා පනතේ 215 යටතේ අයවැය ලේඛනයේ වෙනස්කිරීම් දක්වා ඇතත්, පනතේ නගරාධිපති අරමුදලක් පිළිබඳව සඳහන් නොමැති බැවින් විවිධ අරමුදල් පිහිටුවීම නොකළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 6 වගන්තිය | සියළුම නිවාසවල බදු කාලය වර්ෂ 05 ක් විය යුතු වුවත් නිලධාරීන් 19 දෙනෙක් වසර 5 සිට 30 දක්වා නිවාසවල පදිංචි වී සිටි බව නිරීක්ෂණය විය. | මහා නගර සභාව සතු නිල නිවාස මහා නගර සභාවට අයත් දේපල වේ. මෙම දේපල වල පරිපාලනය සහ භාවිතය මහා නගර සභාවේ ආඥා පනත ප්‍රකාරව මහ සභා අභිමතය පරිදි සිදු කර නිලධාරින් ස්ථාන මාරු වීම් ලැබ යන තෙක් නිල නිවාස වල පදංචි වී සිටීමට සහ ඔවුන්ගෙන් නිල නිවාස කුලිය අය කිරීමට කටයුතු කර ඇත. | වසර 05 න් 05 ට රජයේ නිවාසවල පදිංචිය වෙනස්කර පොරොත්තු ලේඛනය ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි 371 (5) වගන්තිය | 2020 දෙසැම්බර් 31 දිනට ලබාගෙන තිබූ රු.57,280,087 ක අත්තිකාරම් පියවා නොතිබුණි. | අදාල අත්තිකාරම් කඩිනමින් පියවීම සඳහා කටයුතු කරන ලෙස නිලධාරින්ට උපදෙස් ලබා දුනි. | මුදල් රෙගුලාසි උපදෙස් ප්‍රකාරව අත්තිකාරම් නිරවුල් කළ යුතු වේ. |
| (ඈ) | 2020 මාර්තු දින රහිත අංක PL/7/1/18/1 (පොදු) දරන රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | යොමුගත චක්‍රලේඛයේ උපදෙස් අනුගමනය නොකර රු. 10,470,867 ක මුදලක් සභා අරමුදලින් වැයකර සභා බලප්‍රදේශයේ හා සභා බල ප්‍රදේශයෙන් බාහිර පාර්ශවයන්ට නොමිලයේ බඩු මළු බෙදා දීමට කටයුතු කර තිබුණි. | විගණන උපදෙස් පරිදි ඉදිරියේදී කටයුතු කරන බව සඳහන් කරමි. | යථෝක්ත චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | රු.100,000 ක මූල්‍ය සීමාව ඉක්මවා අතුරු අග්‍රිම ලබාගැනීමේදී ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ නිර්දේශ ද සහිතව භාණ්ඩාගාරයේ පූර්ව අවසර ලබාගත යුතු වුවද, ඊට අනුකූල නොවන පරිදි මහා නගර සභාව විසින් වියළි ආහාර සලාක බෙදා දීම සඳහා සීමාව ඉක්මවා රු.5,000,000ක අතුරු අග්‍රිම ලබාදී තිබුණි. | හදිසි අවශ්‍යතාව මත අත්තිකාරම් ලබාගත් බවත්, ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන බවත් දන්වමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.348,176,000 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායමරු.305,279,341 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු වරිපනම් හිඟය රු.108,427,329 ක් විය. | දේපල තහනම් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට සැලසුම් කල නමුත් පැවති කොවිඩ් වසංගත තත්ත්වය නිසා එය ක්‍රියාත්මක කිරිමට නොහැකි විය. 2020.12.31 දිනට රු.87,886,193 ක් වූ හිඟයෙන් රු.29,077,123 ක් 2021.03.31 දින වන විට අය වී ඇත.ඒ අනුව පසුගිය වසරවල හිඟ අය කිරීමෙහි පැහැදිලි වැඩි වීමක් එම මාස 3 තුල ඇත. | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු සංචාරක කුලී හා ලොතරැයි කුටි කුලී ශේෂය රු.2,976,122 ක් විය. | ලොතරැයි කුටි මුළු හිඟය 2021.04.30 දින වන විට අයකර අවසන් බවත් හිඟ මුදල් පවතින සියලු සංචාරක වෙළෙඳුන් පවතින හිඟ මුදලින් 10% බැගින් මාසිකව අය කරන බව දන්වමි. | අයවිය යුතු කුලී ශේෂ කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු ශේෂය රු.64,549,182 ක් විය. එයින් රු.75,000 ට වැඩි හිඟයක් පවතින ජල පාරිභෝගිකයින් 52 කට අදාලව රු.28,076,433 ක හිඟයක් විය. මෙම හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂය අවසානයේ රු.75,000 ක වැඩි හිඟයක් පවතින ජල පාරිභෝගිකයින් 52 න් සමහරු මුදල් ගෙවා ඇති අතර නඩු පැවරීමටද කටයුතු කර ඇත. සියලු හිඟ අයකර ගැනීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි. | හිඟ ජල ගාස්තු අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු අතර වර්ෂයේ බිල් කිරීම කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.7,128,450 ක් හා මුද්දර ගාස්තු රු.117,314,831 ක් විය. | මෙම ගාස්තු කඩිනමින් ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වමි. | අදාළ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කාර්යය සාධනය**

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මළ ප්‍රවාහන සම්බන්ධතා ලබාදීම් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථාවක් පැනවීමට කටයුතු නොකර ගාස්තු අයකර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විට රු.48,682,950 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. | මළ ප්‍රවාහන සම්බන්ධතා වෙනුවෙන් මේ වන විටත් අතුරු ව්‍යවස්ථාවක් සකස් කර ඉදිරි කටයුතු සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. | අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | වාර්ෂිකව දිරන කසල හා නොදිරන කසල ටොන් 5,040ක් එකතු කර දිරන කසල සුන්දරාපොළ සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයට යොමුකර පොහොර නිෂ්පාදනය සිදු කෙරේ.<br>2017 වර්ෂයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත රුපියල් මිලියන 123 ක් වැයකර ස්ථාපිත කර තිබූ කවෂිමා කොම්පෝස්ට් යන්ත්‍රය කසළ ටොන් 50 ක ධාරිතාවයෙන් යුක්ත වුවද එහි උපරිම ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මෙම යන්ත්‍රයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට කසළ හලන යන්ත්‍රයක්, බොබ් කැට් යන්ත්‍රයක් වැනි භෞතික සම්පත්වල ඌනතාව බලපා තිබුණි. | කුරුණෑගල මහා නගර සභාවේ සහ කුරුණෑගල ප්‍රදේශීය සභාවේ කසල (අපද්‍රව්‍ය) බැහැර කරනුයේ සුන්දරාපොළ සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයට වේ. ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීමට හා අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව දන්වමි.<br>. | කසළ කළමනාකරණය විධිමත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.2 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභාවේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා නව මෘදුකාංග යටතේ රාජකාරි කටයුතු සිදුකිරීම සඳහා රු.2,046,000 ක ටැබ්ලට් පරිගණක 60 ක් මිලදී ගෙන තිබුණු අතර, අවශ්‍ය මෘදුකාංග upload කර ප්‍රයෝජනවත් කාර්යයකට යොදාගෙන නොතිබුණි. ක්ෂේත්‍රයේ ජල මනු කියවීම, වරිපනම් බිල් නිකුත් කිරීම, අනතුරුදායක ගස් කැපීම, අනවසර වෙළඳාම ඉවත් කිරීම, ජල නඩත්තු කටයුතු සිදුකරන කාර්ය මණ්ඩලයට ටැබ් පරිගණක ලබා දීමේ අවශ්‍යතාවය විගණනයට තහවුරු නොවීය. | කුරුණෑගල මහා නගර සභාවේ ක්ෂේත්‍ර නිලධාරීන් හට ලබා ගන්නා ලද ටැබ් යන්ත්‍ර සඳහා නව මෘදුකාංගය ඇතුළත් කර ඇති අතර, එමගින් සියලු කටයුතු සිදු කරනු ලබයි. දැනට පවතින කොරෝනා වසංගතය හේතුවෙන් භාණ්ඩ සපයා ගැනීමේ අපහසුතාවය මත ඒ සඳහා මුද්‍රණ යන්ත්‍ර ලබා ගැනීමට නොහැකි වූ බවද දන්වා සිටිමි. | අවශ්‍යතාවය අනුව මිලදී ගැනීම් සිදුකිරීමට කටයුතු කළ යුතු වේ. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු හා නගර සභාවට ආදායමක් ලබාගත හැකි පොදු දේපලක් ලෙස පැවති බුවනෙක හෝටලය පිහිටි ගොඩනැගිල්ල විධිමත් අනුමැතියකින් තොරව කඩාදැමීම සඳහා කුරුණෑගල මහා නගර සභාවේ ඉහළ කළමනාකාරිත්වය කටයුතු කර තිබුණි. මේ සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය සහ නිර්දේශයන් ලබාගෙන නොතිබුණු අතර 2020 ජූලි මස 14 දින අදාළ ගොඩනැගිල්ල කඩා දැමීමට කටයුතු කර තිබුණි. මෙම සිදුවීම සම්බන්ධයෙන් වගකිව යුත්තන් ලෙස නම් කර වරෙන්තු නිකුත් කළ නිලධාරීන් වෙනුවෙන් රු. 7,800,000 ක් නඩු ගාස්තු ලෙස නගර සභා අරමුදලින් ගෙවා තිබුණි. | නගර සභාව සතු දේපලක් බැවින් මහා නගර සභා ආඥා පනත යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව සිය තීරණ සහ කාර්යයන් ක්‍රියාවේ යෙදවීම සඳහා කටයුතු කළ බව කාරුණිකව දන්වා සිටිමි. තවද මහා නගර සභා ආඥා පනතේ 309, 310 වගන්ති මඟින් සුවිශේෂී නීතිමය ආරක්ෂාවක් සකසා ඇති අතර ඒ අනුව සභාව විසින් නීතිඥ ගාස්තු ගෙවීම අනුමත කර ඇත. | පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ගොඩනැගිලි කඩා දැමීමේදී අදාළ ආයතනවල අනුමැතිය හා මහා සභා අනුමැතිය ලබා ගත යුතු වේ. |
| (ආ) | 2020 දෙසැම්බර් 10 දින මහා සභා තීරණය මත මහා නගර සභා නිවාස සංකීර්ණයට අයත් පිඹුරු අංක 2644/79 කැබලි අංක 211 රූඩ් 1 පර්චස් 30 ක ඉඩම අවිධිමත් ලෙස පුද්ගලයෙකුට ලබාදීමට කටයුතු කරන බවත්, මහා නගර සභාවේ දේපල පාලනයකින් තොරව භුක්ති විඳීමට ඉඩ සලසා දී තිබුණි. | මහා සභාව විසින් GC/06/53/2020/12/10 දරණ සභා සම්මුතිය මඟින් සභා සම්මත කර ඇති බැවින් දැනට පදිංචිව සිටින පදිංචිකරුවන් සඳහා එම ඉඩම් විධිමත් පරිදි නියමානුකූල කර දීමට කටයුතු කරමින් පවතී. | මහා නගර සභා ආඥා පනතේ 36 වගන්තිය ප්‍රකාරව විධිමත්ව අනුමැතිය ලබාගෙන ඉඩම් බැහැර කළ යුතු වේ. |
| (ඇ) | මහා නගර සභා පනතේ 36 (1) III වගන්තිය ප්‍රකාරව යම් දේපලක් විකිණීම හෝ අන් ලෙසකින් අන්සතු කිරීම සඳහා ජනාධිපතිවරයාගේ ලිඛිත එකඟත්වය කලින් නොලබා ඒ දේපල විකිණීමට හෝ අන්සතු කිරීමට සභාවට බලය නොමැති වුවද, වැහැරවත්ත මහා නගර සභාව සතු ඉඩම් නීත්‍යානුකූලව පවරා දීමට මහා සභා සම්මතයක් ලබාගෙන තිබුණි. මෙම ඉඩම් සම්බන්ධ ලිපි ගොනුව පරීක්ෂාවේ දී වසර ගණනාවක් අනවසරයෙන් ජීවත්ව සිටින අය කීපදෙනෙක් සිටියද බොහෝ අය අනවසරයෙන් අල්ලාගෙන වගාකටයුතු කරන අය බව නිරීක්ෂණය විය. | මහා නගර සභාව විසින් භාවිතයට නොගන්නා ඉඩම් හඳුනාගෙන විධිමත් සභා සම්මුතීන්ට අනුව මහා නගර සභාවට ආදායමක් හිමිවන පරිදි ඉඩම් පරිපාලනය කළමනාකරණය කර ඇත. | මහා නගර සභා ආඥා පනතේ 361(ii) වගන්තියට අනුව විධිමත්ව ඉඩම් බැහැර කිරීමටද මහා නගර සභා සතු ඉඩම් ආරක්ෂා කිරීමටද ඉඩම් බදු දීමේදී ටෙන්ඩර් ක්‍රම අනුගමනය කිරීමටද කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මහා නගර සභා ආඥා පනතේ 40 (1) ඊ වගන්තියට අනුකූල නොවී වැහැර වෙළඳ සංකීර්ණයේ වර්ග අඩි 6000 ක් පමණ වන A කොටස ස.තො.ස. අලෙවිසැල පවත්වාගෙන යාමට හා වැහැර වෙළඳ සංකීර්ණයේ වර්ග අඩි 1500 ක් පමණ වන ස.තො.ස. ගොඩනැගිල්ලට යාබද කඩ කාමරය අංක 38/52 නිශ්ශංක මාවතේ පදිංචිකරුවෙකුට බදුදීමට කටයුතු කර තිබුණි. | අදාළ ටෙන්ඩර්කරු වන ස.තො.ස. ආයතනය එම බදු ගිවිසුම අත්සන් තැබීම සඳහා ආරක්ෂිත ඇප තැන්පතුව ලෙස රු.75,000 ක් අයකරගෙන ඇත. 2013 වර්ෂයේදී වැහැර ස.තො.ස. A කොටස රු.250,000 කට බදු දී එම බද්ද 10% බැගින් වැඩිකර එය වසර 03 ක් ක්‍රියාත්මක කර, 2019 අප්‍රේල් සිට මෙම කඩ කාමරය 10%කින් වැඩි කර රු.402,628 ට බදු දීමට යෝජනා කර තිබුණද, GC-6(07)2019.04.09 දරණ මහා සභා තීරණය පරිදි පැරණි ක්‍රමය යටතේ වාර්ෂික බදු කුලිය අයකර ගැනීම සහ ලංකා ස.තො.ස ආයතනය වෙතම වාර්ෂික බදු පදනම මත ලබාදීම අනුමත කර තිබුණි. | සභාව සතු වත්කම් බදු දීමේදී පනතේ විධි විධාන ප්‍රකාරව අදාළ අනුමැතිය ලබාගෙන බදු දීමට කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් වන ණය හිමියෝ විවිධ තැන්පතු ලෙස අයිතම 08 ක එකතු වටිනාකම රු. 590,842,593 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසර 1 සිට 5 දක්වා කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.166,767,923 ක් වී තිබුණි. | අදාල ගිණුම් නිවැරදි කිරීම සඳහා කඩිනමින් කටයුතු කරන ලෙස අදාල නිලධාරින්ට උපදෙස් ලබා දෙන ලදී. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුරපති නිල මෙහෙවර වැඩසටහන යටතේ බල ප්‍රදේශයේ ක්‍රියාකාරී ස්වේච්ඡා සංවිධාන සඳහා උපකරණ ලබා දීමේ වැඩසටහන යටතේ 2019 අප්‍රේල් 24 දිනැති පැවති මුදල් කමිටු තීරණයෙන් අනුමත නොවූ රු.1,595,831 ක් වටිනාකම වූ භාණ්ඩ මිලදී ගෙන තිබුණි. මෙම උපකරණ බෙදා දී තිබූ සමිති ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි බවට, ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීමේ ලේඛනය අනුව තහවුරු කරගත නොහැකි විය.2019 වර්ෂය තුල ස්වේච්ඡා සමිති සඳහා බෙදා දී තිබූ උපකරණ අදාළ සමිති විසින් භාරගත් බවට තහවුරු ලබාගෙන නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචිය ලද සමිතිවලට ආධාර ලබා දී ඇත. ස්වේච්ඡා සංවිධානවලට ලබාදෙන ලද භාණ්ඩ හා උපකරණ පිළිබඳව භෞතික පරීක්ෂාවක් සිදුකර වාර්තා කරන බව දන්වමි. | සමිතිවලට භාණ්ඩ බෙදා දීමේදී ලියාපදිංචි සමිති වලට භාරගත් බවට තහවුරු කිරීම් ලබාගෙන එකම සමිතියකට කිහිපවරක් භාණ්ඩ බෙදී නොයන ලෙස ක්‍රමවත්ව සිදුකළ යුතු වේ. |

## 3.5 අවිධිමත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 මාර්තු, අප්‍රේල් කොරෝනා වසංගත කාලය තුළ වියළි ආහාර ද්‍රව්‍ය මිලදී ගත් ප්‍රමාණයන් හා බෙදා දී ඇති ප්‍රමාණයන් පරීක්ෂාවේ දී රු.2,953,153 ක් වටිනා වියළි ආහාර ද්‍රව්‍ය මහජනතාවට බෙදා දීමට අදාළව තොරතුරු විගණනයේ දී තහවුරු නොවීය. | විගණනයේ උපදෙස් පරිදි කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | මුදල් වැය කිරීමේදී සිදුකරන වියදම් වලට අදාළ සාක්ෂි හා වියදම් සනාථ කිරීම් හා බෙදා හැරීමේ විස්තර ඉදිරිපත් කළ යුතු වේ. |
| (ආ) | කසළ කළමනාකරණය ඒකකය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ ඉල්ලීම අනුව පොලිසැක් කවර 45,000 ක් මිලදී ගත යුතු වුවද ප්‍රධාන වෛද්‍ය නිලධාරීන්ගේ ඉල්ලීම අනුව වර්ග 04 ක පොලිසැක් කවර 221,173 ක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව ව්‍යාජ ආයතනයකින් මිලදීගෙන රු. 6,520,089 ක් ගෙවා තිබුණි. පිරිවිතර නොමැතිව ඇතුළත පොලිතින් කවරයද රහිතව මිලදීගෙන තිබූ මෙම කවරවල නියමිත පොහොර ප්‍රමාණය යෙදීමට නොහැකිව තිබුණි. වාර්ෂිකව කිලෝග්‍රෑම් 30,000 ක් පමණ පොහොර නිෂ්පාදනය කර අලෙවි කරන බැවින් ඒ සඳහා වසරකට අවශ්‍ය කවර ප්‍රමාණය 600 ක් පමණ විය.මෙම මළු තොගය ගබඩාවට ලැබී නිකුත් කිරීමේදී හෝ මෙම පරිශ්‍රයට ලැබීමේදී ප්‍රමාණයේ නිවැරදිතාවය කිසිදු නිලධාරියෙකු විසින් පරීක්ෂා කර නොතිබුණි. පොහොර අලෙවියේදී එක් එක් වර්ගයෙන් කොපමණ අලෙවි කළේද යන්න පිළිබඳ ලේඛනගත තොරතුරු පවත්වා නොගැනීම තුළ නිවැරදි කවර තොගය සොයාගත නොහැකි වුවද 2020 සැප්තැම්බර් 12 දින සිදුකර තිබූ භෞතික තොගය සමඟ සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් දක්වා කි.ග්‍රෑ. 29,240 ක අලෙවිය ගැලපීමෙන් මිලදී ගත් පොලිසැක් කවර ප්‍රමාණය ලැබී නොමැති බවත් මේ අනුව කි.ග්‍රෑ. 25 හා 50 බෑග් 87,660 ක කවර ප්‍රමාණයක අඩුවක් විය. | සුන්දරාපොල කසල කන්ද භාර කටයුතු කරනු ලබන නගර සභාවෙහි ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හා එම ස්ථාන භාර මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් ඉදිරි වර්ෂ 02 ක් සඳහා අවශ්‍ය පොලිසැක් බෑග් ප්‍රමාණ පිළිබඳව වාර්තාවක් මත පදනම්ව මෙම භාණ්ඩ ඇණවුම් කර ඇත | සභාවේ අවශ්‍යතාවය අනුව විධිමත්ව ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර මිලදී ගැනීම් කළ යුතු වේ. සහා අරමුදල් වැයකිරීමේදී ආර්ථිකව කාර්යක්ෂමව හා ඵලදායී ලෙස විනිවිදභාවයකින් කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රජයේ ඉඩම් ආඥා පනතේ 27 වන වගන්තිය හා මහා නගර සභා ආඥා පනතේ 36 (1) වගන්තියට අනුකූල නොවී මහා සභා අනුමැතිය හා නගරාධිපතිවරයා විසින් සෘජුව ආණ්ඩුකාරවරයා ඇමතූ ලිපියකට ආණ්ඩුකාරවරයා අත්සන් තැබීම යන අවිධිමත් ක්‍රියාපටිපාටියක් මත ඉඩම් 03 ක් බදු දීමට කටයුතු කර තිබුණි. රජයේ ඉඩම් පවරාදීම සම්බන්ධ වන මග පෙන්වීම් උපදෙස් මැයින් වූ අංක එස්.ඊ.අයි/ඒ/4/34 හා 1995/7/12 දිනැති ජනාධිපති ලේකම් චක්‍රලේඛයේ ඡේද අංක 7 ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් පවත්නා වෙළඳපල තක්සේරුව මත නිගමනය කරන ලද යථාරූපී බදු කුලියක් නියමකර බදු අයකළ යුතු වුවත්, ආදායම් පරීක්ෂක තක්සේරුවක් මත පදනම්ව උක්ත බදුදීම් සිදුකර තිබුණි. | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමාගේ ලිඛිත එකඟත්වය ලබාගන්නා තෙක්, ඕලන්ද සුසාන භූමිය ඉඩම, කුමාරතුංග මාවත ඉඩම, මහ රෝහල ඉදිරිපිට මහජන වැසිකිලිය පිහිටි ඉඩම යන ඉඩම් තුන බදුදී ඇති අතර, පැවරුම් නියෝග ලද පසු අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය වෙත යැවීමට නියමිතය. | මහා නගර සභා ඉඩම් බදු දීමේදී මහා නගර සභා ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත හා අදාළ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. රජයේ තක්සේරුව ලබාගෙන විධිමත් බදු ගිවිසුමකට එළඹිය යුතු වේ. |

## 3.6 දෘශ්‍ය අක්‍රමිකතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභාව යටතේ පාලනය වන පෙර පාසැල් සඳහා ක්‍රීඩා උපකරණ මිලදී ගැනීමට රු.4,481,000 ක් ගෙවීම් කර තිබුණි. මෙම මිලදී ගැනීම සඳහා තාක්ෂණික කමිටු වාර්තාවක් ලිපිගොනුවේ නොතිබුණු අතර, ඒ අනුව තාක්ෂණික ඇගයීමකින් තොරව මෙම උපකරණ ලබාගෙන තිබූ බව නිරීක්ෂණය විය. මෙම ආයතනය පිළිබඳ පරීක්ෂාවේ දී මිලදී ගැනීම සිදුකර ඇත්තේ පෙර පාසල් උපකරණ අලෙවි කරන ආයතනයකින් නොවන බැවින් මෙම මිලදී ගැනීම තුළ අක්‍රමිකතාවයක් සිදුකර රජයට වාසි සහගත වන ලෙස විධිමත් ප්‍රසම්පාදනයක් සිදුකර නොතිබුණි. | විගණන උපදෙස් පරිදි කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධානවලට අනුකූලව සහා අරමුදල් වැය කිරීමට කටයුතු කළයුතු වේ. |

## 3.7 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රතිපාදන මත රුපියල් ලක්ෂ 80 ක් පමණ වැයකර පසු භාවිත ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියක් ආරම්භ කර 2012 වර්ෂයේ දී ප්ලාස්ටික් කැබලි වලට කැපීම හා ප්ලාස්ටික් උණු කිරීම සඳහා යන්ත්‍ර 02 ක් ද සවිකර තිබුණි. එම යන්ත්‍ර 2014 වර්ෂයේ දී පමණ අක්‍රීය තත්ත්වයට | අක්‍රියව පවත්නා ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ ඒකකය යථා තත්ත්වයට පත් කිරීමට හැකි තාක්ෂණ ආයතනයක් වෙත යොමු කර නැවත ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමට යෝජිත වේ. දැනටමත් තාක්ෂණික සහය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. |

පත්වී තිබුණු අතර, නැවත අලුත්වැඩියා කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. එබැවින් ව්‍යාපෘති සඳහා දරන ලද වියදම නිෂ්කාර්යය වියදමක් වී තිබුණි.

## 3.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙම ඉදිකිරීම සඳහා සැලසුම් කර ඉදිකිරීමේ ක්‍රමය තෝරාගෙන තිබුණද, මහා නගර සභාවේ සිවිල් ඉංජිනේරුවරයෙකු හා අනෙකුත් සියළු සම්පත් පැවතියදී හා අනෙකුත් තාක්ෂණික සහාය ලබාගැනීමට හැකියාව තිබියදී මහා නගර සභාවට වඩාත් වාසිදායක වන ආකාරයට අවම පිරිවැයකින් නිල නිවස ඉදිකිරීමට තිබූ අවස්ථාව මෙමගින් අහිමි වී ගොස් තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ප්‍රකාරව දැන්වීමක් පල කළද අදාළ කාල සීමාව ලබා නොදීම හා දෙවන අවස්ථාවේදී කොන්ත්‍රාත්කරුගේ සුදුසුකම් සංශෝධනයෙන් කොන්ත්‍රාත්කරුවන්ගේ ඉදිරිපත්වීම පාලනයක් සිදු වී තිබුණි. මෙම ව්‍යාපෘතිය බිම් මහල හා පළමු මහලයකින් පමණක් සමන්විත බැවින් විදුලි සෝපානයක් (Lift) සවිකිරීමට අවශ්‍යතාවයක් නොමැති වුවද රු. 4,129,600 වැයකර විදුලි සෝපානයක් සවිකිරීමට කටයුතු කර තිබුණි. | විගණනයේ උපදෙස් පරිදි කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | මහා නගර සභාවේ ඉදිකිරීම් සිදුකිරීමේදී මහා නගර සභාවට අයත් වාසිදායක වන ප්‍රසම්පාදන ක්‍රමය තෝරාගෙන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. ඉදිකිරීම් සිදු කිරීමේදී ඉදිකිරීම් ද්‍රව්‍යවල ගුණාත්මකභාවය, ප්‍රමිතියට අනුව වැඩ නිම කිරීම පරීක්ෂා කළ යුතු වේ. |
| (ආ) | මධ්‍යම වෙළඳපල ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 687,068,527 ක ඇස්තමේන්තුවක් සකස් කර රු.948,518,334කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මෙම ඉදිකිරීමට අදාල ප්‍රසම්පාදනයන්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියට අනුව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවක අධිකාරි බලය මත සිදුකළ යුතු වුවද, මහා නගර සභාවේ ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකර තිබුණි. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන්, ප්‍රසම්පාදන හා ඇගයීම් කමිටු පත්කිරීම,ලංසු නිවේදනය සකස් කිරීම | වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුව වෙත මුල් ඇස්තමේන්තුව යොමු කර එහි කමිටු නිර්දේශය මත මෙහි මුල් ඇස්තමේන්තුවේ වායු සමීකරණ පද්ධතිය හා Provisional sum හි අගයන් වෙනස් කරන ලදී. | ඇස්තමේන්තුව BSR (අනුමත ගොඩනැගිලි) අනුව සකස් කළ යුතු අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ටෙන්ඩර් ප්‍රදානය කර ඉංජිනේරු හා තාක්ෂණික නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඉදිකිරීම් ප්‍රමිතියට කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ඇතුළු ලංසු ලේඛණ පිළියෙල කිරීම, ප්‍රසම්පාදන කමිටු රැස්වීම් පැවැත්වීම, ලංසු නිවේදන ප්‍රසිද්ධ කිරීම, ලංසු ඇපකර ලබාගැනීම, ලංසු ඇගයීම ඇතුළු ප්‍රසම්පාදන ක්‍රියාවලිය පුරාම අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය විය. මෙම ප්‍රසම්පාදන කටයුතු ඇරඹි දින සිට ලංසුව ප්‍රදානය කිරීම දක්වා කාලය තුළ අදාල කටයුතුවලට සම්බන්ධ වී ඇති පාර්ශවයන් හා ආයතන ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවූ රු.281,934,447ක මුදලකට හෙවත් සියයට 41 ක් ඉක්මවූ මිලක් ඉදිරිපත් කරන ලද ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. | සංශෝධිත ඇස්තමේන්තු සකස් කර වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තු වේ අනුමැතිය ලබාගෙන ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇති අතර ඉන් පසුව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදි. | |
| (ඇ) | මාළිගාපිටිය ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව රු. 165,207,414 ක් වූ කොන්ත්‍රාත්තුව සඳහා මිල කැඳවීම් අනුව රු. 185,456,135 ක් හා රු. 300,655,750 ක් ලෙස මිල ගණන් දෙකක් ලැබී තිබුණි. එම මිල ගණන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 7.9.2 අනුව රු. මිලියන 500 නොඉක්මවන කොන්ත්‍රාත්වල විස්තරාත්මක ලංසු ඇගයීම් මූලධර්ම සහ ක්‍රමවේද අනුගමනය නොකර හා අවම ලංසු මිල ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා 18% කින් වැඩි වී තිබියදී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ලබා දී ඇති උපදෙස් අනුව ප්‍රසම්පාදන ක්‍රම තෝරා ගැනීම ලංසු කැඳවීම, ලංසු ඇගයීම මිල විචලතා සලකා බලා කොන්ත්‍රාත් ප්‍රදානය කළ යුතු වේ. |

## 3.9 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් සභාවේ ගිනි නිවන අංශය සඳහා තනතුරු 05 කට අදාළව සේවකයින් 36 ක් අනුමත කර තිබූ නමුත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් එම සේවාවට අදාළව සේවා ව්‍යවස්ථාවක් සකස් කර නොතිබූ බැවින් අනුමත කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම සේවා ව්‍යවස්ථාව පිළියෙල කර පළාත් පාලන කොමසාරිස් මඟින් ආණ්ඩුකාරතුමාට යොමු කිරීමට කටයුතු කර ඇති බව දන්වමි. | සේවා ව්‍යවස්ථාව අනුමත කර මෙම සේවාවට අදාළ කාර්යය මණ්ඩලය බඳවාගෙන මෙම සේවාව කාර්යක්ෂමව ඉටුකිරීමට කටයුතු කළ යුතු වේ. |

**04.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1** **පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ධාරිතාවය 24,000L ඉක්මවූ මළ අපද්‍රව්‍ය කළමනාකරණ අංගනය ක්‍රියාත්මක වෙමින් පවතින අතර, එයින් ඉවතලන අපජලය ස්වභාවික මතුපිට ජල බැස්මකට මුදාහැර තිබුණි. එමඟින් වන ජල මාර්ග දූෂණය වැළැක්වීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මළ අපද්‍රව්‍ය විවෘත භූමියට මුදා හැරීම තුළින් අභ්‍යන්තර ජල මූලාශ්‍ර වලට වන බලපෑම පිළිබඳ අවශ්‍ය සැලසුම් සහ ක්‍රියාමාර්ග ගැනීම සඳහා නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ අවධානයට යොමු කර ඇත. මේ සම්බන්ධයෙන් විගණනයෙන් පෙන්වා දී ඇති මාර්ගෝපදේශ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමි. | ස්වභාවික පරිසර පද්ධතීන්ට සිදුවන හානි අවම වන පරිදි කසළ බැහැර කිරීම් විධිමත් කිරීමට කටයුතු කළ යුතු වේ. |